**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2014**

-------------------------------------------------------------

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 අනුව ගිණුම් ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් කර දැක්විය නොහැකි වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දේ වලට අදාළ වටිනාකමින් රු.81,485,839 ක බැංකු ඍණ ශේෂය අඩුකර දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.මිලියන 500 ක මුදල සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගැලපීම වෙනුවට මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයේ මූල්‍ය වියදම් වලට ඇතුළත් කර තිබුණි.

(ආ) වර්ෂ 02 කට වැඩි කාලයක සිට පරිශේෂව පවතින ණයගැති ශේෂ සහ ලැබිය යුතු ශේෂ රු.4,090,670 ක අයවීමේ සම්භාවිතාව සලකා බලා ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට අදාළ ණයහිමි ශේෂය රු.8,187,104 ක් වුවත් සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයට අදාළ ණයගැති ශේෂය රු.8,753,371 ක් වූයෙන් රු.566,267 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ තානාපති කාර්යාල වලට ප්‍රේෂණය කරන ලද රු.655,474,602 ක් වෙළඳ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණද වියදම සනාථ කිරීමට අදාළ ටෙන්ඩර් ලියවිලි, ඉන්වොයිසි පත්‍ර හා අදාළ පාර්ශවයන්ට මුදල් ලද බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වාර්තාවට ඇතුළත් කර තිබූ රු.38,565,610 ක ප්‍රමාණය තහවුරු කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) එක්සත් ජනපද ප්‍රවර්ධන කාර්යාලයෙන් හා බාහිර පාර්ශවයකින් ලැබිය යුතුව තිබූ රු.3,304,920 ක් දීර්ඝ කාලයක් පරිශේෂව පැවතුනද එම ශේෂවලට අදාළ පාර්ශවයන්ගෙන් සනාථ කරගෙන නොතිබුණි.

**2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ වලින් එකතුව රු. 2,448,920 ක් වසර 4 ඉක්මවා තිබූ අතර එකතුව රු. 1,594,844 ක් වසර 01 සිට වසර 04 දක්වා පැරණි ශේෂ වලින් සමන්විත වී තිබුණි. තවද ගෙවිය යුතු ශේෂ වලින් රු.48,000 ක් වර්ෂ 04 ඉක්මවා තිබුණු අතර රු.7,836,960 ක් වසර 02 සිට වසර 04 දක්වා පැරණි ශේෂ විය.

**2.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

---

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය | සෑම ලිත් වර්ෂයක් අවසාන වී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාව, අර්ධ වාර්ෂික ගිණුම් වාර්තාව, ඉදිරි 03 අවුරුදු කාල සීමාවකට අපේක්ෂිත සැලැස්ම හා පූර්ව වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද සැලසුම් සම්බන්ධයෙන් වූ කාර්යය සාධනය ඇතුළත් ප්‍රකාශනයන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) 10 වගන්තියේ 5 උපවගන්තිය | යම් වර්ෂයක ශුද්ධ අතිරික්ත ආදායමින් ඉතිරි සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 16 වගන්තියේ 2 හා 3 උපවගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.81,485,839 ක බැංකු අයිරාව සඳහා අදාළ ඇමතිවරයා හා මුදල් ඇමතිවරයා යන දෙදෙනාගේ එකහත්වය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 | වලංගු කාලය ඉක්ම වූ රු.139,573 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12
දරන යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර
මාර්ගෝපදේශ චක්‍රලේඛයේ
9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය

මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වන සියළුම කාරණා පිළිබඳව පනවනු ලබන රීති සහ රෙගුලාසි භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ යුතු වුවත් කාර්යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------------

2011 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 57 ප්‍රකාරව මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව, එක්තරා පෞද්ගලික ආයතනයකට රු.5,000,000 ක අනුග්‍රාහක දීමනාවක් ලබා දී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.17,936,798 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.118,913,920 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.100,977,122 ක පිරිහීමක් විය. සමාලෝචිත වර්ෂය තුල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ රු.මිලියන 500 ක මුදල මූල්‍ය වියදම් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි**

------------------------------------------------------------

ජාත්‍යන්තර ඉන්දියානු සිනමා සම්මාන උළෙල වෙනුවෙන් රු.120,694,486 ක ගෙවීම් ලබාදෙන ලෙස සේවා හා සැපයුම් ලබා දුන් පෞද්ගලික ආයතන හා පාර්ශවයන් විසින් කාර්යාංශයට එරෙහිව ගොනුකර තිබුණ නඩු 08 ක් සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් අධිකරණයේ විභාග වෙමින් පැවතුණි.

**3.3 වියදම් වල අසාමාන්‍ය වැඩිවීම**

------------------------------

2013 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වියදම් විෂයයන් 09 ක රු.683,787,300 ක අසාමාන්‍ය වැඩිවීමක් නිරීක්ෂණය විය.

**3.4 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ පූර්ව වර්ෂ දෙකකට අදාළව ගණනය කරන ලද කාරක ප්‍රාග්ධන අනුපාත අනුව ඉහල ද්‍රවශීලතාවයක් පවතින බව නිරීක්ෂණය වූ අතර අඛණ්ඩව කෙටිකාලීන ආයෝජන වල මුදල් යොදවා තිබීම මෙයට හේතු වී තිබුණි.

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| ජංගම | 10.1:1 | 5.25:1 | 2.84:1 |
| ක්ෂණික | 9.96:1 | 5.2.2:1 | 2.83:1 |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයේ වෙළඳ කටයුතු වියදම රු.මිලියන 1,562 ක් වූ අතර පෙර වර්ෂයේ එම වියදම සමඟ සැසඳීමේදී සියයට 12.9 කින් අඩු වී තිබුණි. එහෙත් සංචාරකයන්ගේ පැමිණීම 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 19.8 කින් වැඩි වී තිබුණු අතර ශ්‍රී ලංකාව ලැබූ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් බිලියන 0.716 ක් හෙවත් සියයට 41.7 කින් වර්ධනය වී තිබුණි. මේ අනුව සංචාරකයින්ගේ පැමිණීම හෝ ශ්‍රී ලංකාවේ සංචාරක ආදායම කෙරෙහි වෙළඳ වියදම් සෘජුව බලපාන බව තහවුරු නොවිය.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 03 දින සිට 2014 නොවැම්බර් 06 දක්වා එක්සත් රාජධානියේ පැවැත් වූ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව මිළදී ගන්නා ලද රු.350,000 ක් වටිනා මැණික් ගල් 02 ක් හා නොමිලේ කාර්යාංශය වෙත ලැබී තිබූ මැණික් ගල් 02ක් තොග පොත්වල ඇතුළත් කර නොතිබුණු අතර නොමිලේ ලැබී තිබූ මැණික් ගල් 02 හි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා අනුව කාර්යාංශයට ලැබී තිබුණු මැණික් ගල් 4 හි බර කැරට් 1.4,1.6,1.63 හා 1.54 ක්වූ අතර ඉන්වොයිසි අනුව රු.350,000 කට මිලදී ගත් මැණික් ගල් දෙකක බර කැරට් 5.6 ක් වූයෙන් ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා සමඟ මැණික් ගල් වල බර නොසැසඳීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ආ) එක්සත් රාජධානියේ පැවැත්වූ වෙළඳ ප්‍රදර්ශනය (WTM (UK) 2014) වෙනුවෙන් වෙළඳ ප්‍රදර්ශන කුටි ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව ලබා දීමේදී මිල කැඳවුම් ලිපි විවෘත කළ යුතු දිනට දින 4 කට පෙර විවෘත කිරීම, ටෙන්ඩර්කරු හෝ නියෝජිතයෙක් ටෙන්ඩර් ලිපි විවෘත කරන අවස්ථාවට සහභාගී නොවීම, කොන්ත්‍රාත්කරු බ්‍රිතාන්‍ය තනාපති කාර්යාලය සමඟ ගිවිසුමකට එළඹ එහි පිටපතක් ප්‍රවර්ධන කාර්යාංශය වෙත එවිය යුතු බවට උපදෙස් දී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබීම සහ වෙළඳ ප්‍රදර්ශන කුටි සාර්ථකව ඉදිකළ බවට වගකිවයුතු නිලධාරියෙකුගේ සහතිකයක් නොතිබියදී ඉහත ඉදි කිරීම සඳහා රු.17,803,508 ක ගෙවීමක් කාර්යාංශය මඟින් සිදු කර තිබුණි.

(ඇ) රුසියාවේ මොස්කව් නුවර පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහන (Leisure Travel and Tourism fair – 2014) සඳහා ටීෂර්ට් මිල දී ගැනීම වෙනුවෙන් රු.7,800,000 ක් වැය කර තිබූ නමුත් එම ටීෂර්ට් තොගය කාර්යාංශය වෙත ලැබී නොතිබූ අතර මිලදී ගැනීම් වෙනුවෙන් පිළියෙල කළ ලේඛන විගණනයේදී පිළිගත නොහැකි විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ලෝක සංචාරක දිනය පදනම් කරගෙන රු.5,824,000 ක් වැයකර මුද්‍රණය කරනලද ටීෂර්ට් තොගය දේශපාලන පක්ෂයක ප්‍රචාරක කටයුතු සඳහා යොදාගත්

බව ද්‍රව්‍ය සැපයුම් ආයතනයේ අධ්‍යක්ෂකගෙන් තහවුරු වී තිබියදී මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කිරීමට විගණිත දිනය වූ 2016 අගෝස්තු මාසය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) සංචාරක ක්ෂේත්‍රය තුළ සාමාජීය වගකීම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික ආයතන දෙකකට ගෙවන ලද රු.99,439,900 (බදු රහිත) ක මුදල ආයතනයේ පරමාර්ථ ඉටුකිරීම සඳහා යෙද වූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට අමාත්‍යවරයා විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබූ බව අනාවරණය විය. මෙකී කමිටුව වාර්තාවක් අදාළ අමාත්‍යවරයා වෙත භාර දී ඇති බවත් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු මේ දක්වා ආරම්භ කර නොමැති බවත් කාර්යාංශයේ සභාපතිවරයා විගණනයට දන්වා තිබුණි.

(ඊ) හෝම්ස්ටේ ප්‍රචාරාත්මක වැඩසටහන නිර්මාණය සඳහා වන රු.මිලියන 33.9 ක් වන කොන්ත්‍රාත්තුව රාජ්‍ය ආයතනයකට භාරනොදී සීමිත මිල ගණන් යටතේ පුද්ගලික ආයතනයකට ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව ලබා දී තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත රු.14,500,000 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ අතර අදාළ කාර්යය ඉටු කිරීමෙන් තොරව නැවත මාස 8 ක කාලයක් මුදල් අත රඳවා ගෙන 2015 වර්ෂයේ දී නැවත කාර්යාංශය වෙත ගෙවීමෙන් රජයේ මුදල් අයථා පරිහරණයට ඉඩ සලසා දී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 4.3 ආර්ථික නොවන ගනුදෙනු

-------------------------------

චීන මාධ්‍යවේදීන් 12 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් වෙනුවෙන් රු.3,506,757 ක වියදමක් දරා ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ශණීය ප්‍රදේශ කීපයක් ආවරණය වන පරිදි සිදු කල Familiarization Tours පිළිබඳ වාර්තා, චීන මාධ්‍ය මඟින් ප්‍රචාරය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී. ඒ අනුව මෙම චාරිකාව සඳහා දරන ලද පිරිවැය ආර්ථික නොවන වියදමක් ලෙස නිරීක්ෂණය විය.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 88 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩල 45 ක් වූයෙන් පුරප්පාඩු 43 ක් විය. කාර්යාංශයේ ඉහළ කළමනාකරණයේ සැළකියයුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීමෙන් සංචාරක ප්‍රවර්ධන කටයුතු ප්‍රශස්ථ මට්ටම කරා ගෙනයාමට බාධාකාරී වී තිබූ බව නිරීක්ෂණය විය.

## 4.5 වාහන උපයෝජනය

------------------------

වාහන කුලියට ලබාගැනීමේදී කිලෝ මීටරයකට රු.40 ක් ගෙවීමට එකඟ වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී කිලෝමීටර් 95,692 ක් ධාවනය කිරීම වෙනුවෙන් වාහන කුලී ලෙස රු.4,784,181 ක් ගෙවා තිබුණි. දිනකට අවම කිලෝමීටර් ගණන ධාවනය කර නොතිබීම හේතුවෙන් එක් ධාවන කිලෝමීටරයකට රු.50 ක් වැයවී තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කලයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ

මූල්‍ය ප්‍රකාශන මාස 10 ක ප්‍රමාදයකින් පසුව එනම් 2016 ජනවාරි 05 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට ආයතනයේ ශක්තිය, දුර්වලතා, වාසි වූ අවස්ථා සහ තර්ජන හඳුනාගෙන ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම මෙම ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් ද හඳුන්වා දී නොතිබුණි.

(ආ) කාර්යාංශය විසින් 2014 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීමේ දී වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 137 න් 94 ක් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

----------------------

කාර්යාංශයේ අභ්‍යන්තර විගණනය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පවරා තිබුණ ද අභ්‍යන්තර විගණන සැලැස්මේ පිටපතක් සහ අර්ධ කාලීන විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ 4 පරිච්ඡේදයේ 4.2.1 (අ) සහ (ඇ) වගන්ති අනුව ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම සමඟ අවම වශයෙන් වසර තුනක් ආවරණය වන සේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද, කාර්යාංශය විසින් එම සැලැස්ම සකස් කර නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණ ද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තියේ නියමයන් පරිදි එය මුදල් වර්ෂයට මාස තුනකට පෙරාතුව පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ විෂයයන් 35 ක අයවැය ගත සංඛ්‍යා තථ්‍ය සංඛ්‍යා සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) අයවැය ලේඛනමය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) වෙළෙඳ හා අලෙවිකරණ ක්‍රියාකාරකම්
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ප්‍රසම්පාදනය
(ඊ) අභ්‍යන්තර විගණනය
(උ) මූල්‍ය කළමනාකරණය